# වෘත්තීයික ඇසින්

එක්සත් රාජධානියේ වෘත්තීයික ශ්‍රී ලාංකිකයන්ගේ සංගමයේ ප්‍රකාශනය - අංක 1: දූෂණය.

## 1.0 හැඳින්වීම

එක්සත් රාජධානියේ වෘත්තීයික ශ්‍රී ලාංකිකයන්ගේ සංගමයේ දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන යටතේ, අධ්‍යාපනික ලිපි මාලාවක් ලියා, පුළුල් ලෙස පළ කරනු ඇත. සාමාජිකයන්ගේ ඒකමතික තීරණයෙන් ලිපි මාලාව සඳහා තෝරා ගත් පළමු වන මාතෘකාව වූයේ 'දූෂණය' යි. අපේ නූතන සමාජයට, අධ්‍යාපනය මගින්, මේ විවාදාපන්න ගැටලුව සාර්ථක ව විසඳිය හැකි ය යන විශ්වාසය අප සතු ය. එක්සත් රාජධානියේ වේක්ෆීල්ඩ් නගරයේ මෑතක දී පැවැත්වූ සම්මන්ත්‍රණයක දී දූෂණය මුළුමනින් ම තුරන් කළ නොහැකි නම්, ඒ සඳහා හේතු, එහි ප්‍රතිඵල හා දූෂණය අඩු කළ හැකි මාර්ග ගැන සහභාගි වන්නෝ සාකච්ඡා කළහ; වාද විවාද කළහ; එකී සාකච්ඡාවේ හරය මෙසේ ප්‍රසිද්ධ කරනුයේ උනන්දු සගහත රටවලට ප්‍රයෝජනයට ගැනීමට ය. මේ විෂයය ගැන තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා වූ ආරම්භක අවස්ථාවක් ලෙස ද මේ ප්‍රකාශනය සැලකිය හැකි ය. මෙහිදී "විනිවිදභාවය සඳහා වූ අන්තර් ජාතිකය' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්) මෑතක දී පළ කළ දත්ත ද පරිශීලනය කෙරිණි. එය දූෂණ සංජානන දර්ශකයක් නිර්වචනය කර ඒ පාදක කර ගෙන රටවල් 180ක් තරා කර ඇත. මේ පරිමාණය අනුව ලකුණු 10කින් ඇඟවෙන්නේ අවම දූෂණ මට්ටමකි. 0 යනු ඉහළ ම මට්ටමේ දූෂණය පවතින බවකි (1 වන රූපය බලන්න).




1 වන රූපය : දූෂණ සංජානන දර්ශක ලකුණු අනුව ලෝක සිතියම - 2006

පරිමාණය අනුව රටවල් කීපයකට අදාළ දත්ත 1 වන වගුවේ දැක්වේ.

**1 වන වගුව: 2007 වර්ෂයේ ප්‍රකාශිත පරිදි දූෂණ සංජානන දර්ශකය අනුව රටවල් තරා වන අයුරු**

| තරාව | රට | දූෂණ සංජානන දර්ශක ලකුණු | තරාව | රට | දූෂණ සංජානන දර්ශක ලකුණු |
|---|---|---|---|---|---|
| 1 | නවසීලන්තය | 9.4 | 51 | කියුබාව | 4.2 |
| 2 | ඩෙන්මාර්කය | 9.4 | 75 | ඉන්දියාව | 3.5 |
| 3 | ෆින්ලන්තය | 9.4 | 91 | තායිලන්තය | 3.3 |
| 4 | සිංගප්පූරුව | 9.3 | - | - | - |
| 5 | ස්වීඩනය | 9.3 | 95 | ශ්‍රී ලංකාව | 3.2 |
| - | - | - | - | - | - |
| 10 | කැනඩාව | 8.7 | 110 | ඊජිප්තුව | 2.9 |
| 11 | ඔස්ට්‍රේලියාව | 8.6 | 138 | පකිස්තානය | 2.4 |
| 13 | එක්සත් රාජධානිය | 8.4 | 146 | රුසියාව | 2.3 |
| 16 | ජර්මනිය | 7.8 | 148 | නයිජීරියාව | 2.2 |
| 17 | ජපානය | 7.5 | 151 | කසකස්තානය | 2.1 |
| 20 | එක්සත් රාජධානිය | 7.2 | 162 | බංගලාදේශය | 2.0 |
| 43 | මැලේසියාව | 5.1 | - | - | - |
| 45 | දකුණු අප්‍රිකාව | 5.1 | 172 | ඇෆ්ගනිස්තානය | 1.8 |
| 57 | නැමීබියාව | 4.5 | 178 | ඉරාකය | 1.5 |
| 58 | ෂීෂෙල්ස් | 4.5 | 179 | සෝමාලියාව | 1.4 |

**මේ දත්ත අනුව එළැඹිය හැකි පැහැදිලි නිගමන කීපයකි.**

(අ) ලෝකය වටා ම ඇති රටවල් රැසක් දූෂණයෙන් පෙළෙති. දූෂණය අඩු ම රටවල් ආර්ථික වශයෙන් දියුණුව සහිත ය; අඩු අභ්‍යන්තර ගැටුම් සහිත ය. දූෂණය වැඩි නම් ඒ දුප්පත් රටකි; විවිධ ගැටලු ද ඒ රටවල පවතී. එනිසා දූෂණය හා ආර්ථික සංවර්ධනය අතර දැඩි සහසම්බන්ධයක් තිබේ.

(ආ) ගැටුම්වලින් තැලී පොඩි වුණු රටවල් (ඇෆ්ගනිස්තානය, ඉරාකය සහ සෝමාලියාව) වඩාත් දූෂිත ය. රාජ්‍ය ආයතන ක්‍රියාත්මක නො වන අතර එනිසා ම දූෂණය සඳහා වන අවකාශය ද සැපයී ඇත.

(ඇ) අප්‍රිකාවේ මෑතක දී දූෂණ විරෝධී ව්‍යාපාර ඇති වූ රටවල (දකුණු අප්‍රිකාව, සැම්බියාව, සීසෙල්ස්) සැලකිය යුතු දියුණුවක් ලබා ඇත. අනෙකුත් රටවලට ද මෙය ආදර්ශයක් වන්නේ උචිත ක්‍රියාමාර්ග ගැනීමෙන් දූෂණය අඩු කිරීමටත් ආර්ථික සංවර්ධනයටත් එමගින් මාර්ගය පෑදී ඇති නිසා ය.

පෙර කී සම්මන්ත්‍රණයේ දී දූෂණයට බලපාන හේතු සහ එහි ප්‍රතිඵල විශ්ලේෂණය කෙරිණි. පාලකයන්ට මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කළ යුතු පොදු ක්‍රියාකාරකම් ගැන ද ඒකමතික ව එකඟ විණි. සමාජයේ යහපතත් වඩා ඉහළ ජීවන මට්ටමක් සඳහාත් දූෂණය නැති කිරීමට හෝ අවම කිරීමට උචිත ලෙස මේ යෝජනා සැකසිණි.

## 2.0 දූෂණයට හේතු

විස්තරාත්මක ව සාකච්ඡා කිරීමට පෙර දූෂණය යන්න නිර්වචනය කිරීම උචිත ය. එයට

විවිධ නිර්වචන තිබිය හැකි නමුත් විනිවිදභාවය සඳහා වූ අන්තර්ජාතිකයේ නිර්වචනය වන්නේ 'පැවරුණු බලය පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා වැරදි ලෙස පරිහරණය කිරීම යි.'

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අඩු වැටුප, දූෂණය සඳහා බලපාන හේතුවලින් වැදගත් ම කරුණයි. මේ නිසා අල්ලස් ලබා ගෙන ස්වකීය ජීවන තත්ත්වය (නිවාස තැනීම, දරුවන්ගේ අධ්‍යාපනය) වැඩි කර ගැනීමට රජයේ සේවකයෝ පෙලඹෙති. මෙය දුප්පත්කම විසින් ඇතිදැඩි කළ දූෂණයකි. එහෙත් සැබෑ හේතුව වන්නේ පුද්ගල කෑදරකමයි. සමහර දුප්පත් ජන සමාජවල අවංක ජනතාව, සාමකාමී ව හා සතුටුදායක ලෙස ජීවත් වෙති. සත්‍ය වශයෙන් ම දූෂණය නිසා දුප්පත්කම පොෂණය වී උපරි ව්‍යුහය මෙන් ම ආචාරධර්ම හා සංස්කෘතික අගයයන් ද කඩා වැටේ.

දූෂණය සඳහා තවත් හේතුවක් වන්නේ නීතියේ ඇති හිඩැස් ය. මේ වාතාවරණය නිසා පුද්ගලයන්, ආයතන හා රජය ක්‍රමානුකූල ව දූෂණයේ නිරත වෙති. කලකට පසු මේ අවව්‍යවහාර සමාජ ක්‍රියාවලියේ කොටසක් බවට පත් වේ. එවිට ඒ ගැන වාර්තා කිරීමට විනිවිදභාවය සහිත පද්ධති නැති වේ. දූෂණ ගැන හෙළි කරන අයට ආරක්ෂාව ද නැති වේ. එමගින් දූෂකයන්ට නීතියෙන් ගැලවී යාමට ඉඩ සැලසේ. මේ නිසා දූෂණය ආයතනගත වී ඇත. සමහර අධ්‍යයන අනුව, අවංක පුද්ගලයන් පවා අල්ලස වැනි දූෂණ ක්‍රියාවලියට පොලඹවනු ලැබෙන්නේ සමාජයේ නොනැසී පැවතීමට හා අවශ්‍ය දේ කර ගැනීමට එය අවශ්‍ය හෙයිනි.

## 3.0 දූෂණයේ බලපෑම

දූෂණයේ ප්‍රධාන ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ එමගින් රටක ආර්ථික වර්ධනයට හා සමාජ සංවර්ධනයට වන පසුබෑමයි; එසේ ම දුප්පතුන්, දුප්පත්කම තුළ හිර වීම යි. ඉතා අනතුරුදායක මට්ටමේ සිටින කාන්තාවන්, ළමයින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හා රෝගීන් මේ නිසා පීඩනයට පත් වන අතර, සමාජයේ ඉතා සුළු කොටසක් ජීවන රටාවේ නොසිතිය හැකි තලයේ පහසුකම් හා ජීවන මට්ටමක ජීවත් වෙති. දිගු කලක් ගත වන විට අසරණභාවය ස්ථාවර ඉගෙනුමක් බවට පත් වන අතර එය ජාතික මනසේ ද ස්ථාවර ව තැන්පත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස දූෂණ ව්‍යවහාර ප්‍රතිමානයක් ලෙස පිළිගැනීමට ලක් වේ. චර්යා ධර්ම පද්ධතියට හානි වී, අන්තරාදායක ප්‍රතිඵල ඇති වේ. එකී අන්තරාදායක ප්‍රතිඵල නම්, සදාචාරය අවම වීම, සමාජය හා එහි සංවිධාන පිළිබඳ දුර්වල සංජානනය සහ විශ්වාසවන්තභාවය, රට පිළිබඳ දුර්වල ගෞරවය, අඩු කාර්යක්ෂමතාව, සම අවස්ථා අහිමි වීම සහ බුද්ධි ගලනය වේ.

සමාජය හා පරිසරයට වන ද්විතීයික හා සමුච්චිත බලපෑම අතිමහත් ය; දිගුකල් පවතින සුළු ය. උදාහරණයක් වශයෙන් දූෂිත සමාජයක බලය අයථා ලෙස පරිහරණය, අනාගත පරම්පරාවට අනුචිත පූර්වාදර්ශයක් සපයයි. දූෂණය අත්‍යවශ්‍ය ක්‍රියාවලි ප්‍රමාද කරන නිසා, නිලධාරී වාදය වර්ධනය වෙයි. රාජ්‍ය ආයතනවල වියදම අතිශය ලෙස ඉහළ යන අතර ම, ජාතික ආපදා අවස්ථාවලට ලබා දෙන විදේශ ආධාර අපපරිහරණය වේ.

අධිකරණ පද්ධතියේ අත්‍යවශ්‍ය ඒකාග්‍රතාව පිරිහී ගොස් පොලීසිය, රේගුව, ආනයන අපනයන ක්ෂේත්‍ර, දූෂණයෙන් වඩාත් බලපෑම් ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රටේ පැවැත්මට අවශ්‍ය බදු අඩු වේ. අවසානයේ සාමාන්‍ය ජනතාවට දුක් විඳින්නට සිදු වේ.

## 4.0 දූෂණය අවම කිරීම සඳහා යෝජනා

දූෂණය සමාජ සංවර්ධනයට දැඩි අනර්ථයක් කරයි. එබැවින් පළල් වශයෙන් පහත සඳහන් ක්‍රියා දූෂණය අතු ගා දැමීමට අවශ්‍ය වේ.

1. රටේ සෑම ක්ෂේත්‍රයක ම ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් සංවර්ධනය කර පවත්වා ගෙන යාම සහ විෂයමාලාව රටේ සංවර්ධනය වන අවශ්‍යතා අනුව නවීකරණය කිරීම.
2. අවශ්‍ය තොරතුරු, ක්‍රම සහ මාර්ගවලින් සාමාන්‍ය ජනතාව දූෂණය ගැන බලවත්ත කිරීම සහ සෑම පුද්ගලයකු ම දූෂණය අවම කිරීම සඳහා හොඳ නිදසුනක් වන සේ සංස්කෘතිය සංවර්ධනය කිරීම.
3. කෙටි කාලීන පෞද්ගලික අපේක්ෂාවලින් තොර ව රටේ යහපත තකා ඡන්දය පාවිච්චි කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීම සහ බලවත්ත කිරීම; සංගතතාවෙන් යුතු අවංක නායකයන් ප්‍රජාතන්ත්‍රවාදය මගින් පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු යෙදීම; රටේ දේශප්‍රේමීත්වය නිර්මාණය කිරීම.
4. සංවර්ධනය වන රටවල, ඉතා හොඳ ආයතනික පදනම් ගොඩ නැගුණු සමාජ තහවුරු කළ යුතු ය. රාජ්‍ය ආයතන සවිමත් කර, සමාජ සංවර්ධන වැඩසටහන්වලට ඒකාග්‍රතාවෙන් සහ දූෂණයෙන් තොර ව කටයුතු කිරීමට ඉඩ සලසා දීය යුතු ය.
5. පිරිසිදු සහ කාර්යක්ෂම අධිකරණ සේවාවක් පිහිටුවා නීතිය සහ සාමය පවත්වා ගෙන යාම. දේශපාලන බලපෑමෙන් තොර ව අධිකරණ ක්‍රියාදාමය මුළුමනින් ම ස්වාධීන විය යුතු .ය. ධනය සහ බලය නොසලකා නීතිය සමාන ව ක්‍රියාත්මක කළ යුතු ය.
6. රාජ්‍ය ව්‍යාපාර සහ සිවිල් සමාජ නියෝජිතයන් එකට කටයුතු කරමින් සම්මත ක්‍රියාමාර්ග ගොඩ නඟා ගෙන ඉහළ විනයෙන් යුතු ව ඒවා ක්‍රියාත්මක කළ යුතු ය.
7. සෑම පරිපාලන තීරණයක දී ම, ව්‍යාපාර ගනුදෙනුවක දී ම, සහ පුණ්‍ය කටයුත්තක දී ම විනිවිදභාවය වැඩි දියුණු කළ යුතු ය. සිවිල් සේවකයන්, කළමනාකරුවන්, භා භාරකරුවන්ගේ ක්‍රියාකාරකම් දෘශ්‍යමාන විය යුතු ය; අනාවැකි කළ හැකි විය යුතු ය; තේරුම් ගත හැකි විය යුතු ය.
8. දූෂණය සහ වංචාව මැඩලීම සඳහා වූ යාන්ත්‍රණයක් සම්පූර්ණ බලය සහිත ව පිහිටුවා ඊට අදාළ සිද්ධි ස්වාධීන ව විමර්ශනය කළ යුතු ය. සෑම දෙනා ම ඔවුන්ගේ ක්‍රියා සඳහා වගකිව යුතු තත්ත්වයට පත් කොට වැරදි මතු වූ විට ඒවා හෙළි කර සිටීමේ යාන්ත්‍රණයක් ඇති කළ යුතු ය.
9. දියුණු රටවල් ස්වකීය මුදල් ආයතනවලට වඩාත් වැඩියෙන් නීති පනවා ක්‍රියාත්මක කළ යුතු ය. එමගින් දූෂිත ව ඇති දුප්පත් රටවලින් මුදල් ගසා කා තැන්පත් කර ගැනීමේ රටා වළක්වාලිය යුතු ය.
9. පෞද්ගලික සහ රාජ්‍ය ක්ෂේත්‍රවල සියලු ආකාර නිලධාරී තන්ත්‍ර, කුසලතා තන්ත්‍ර ලෙස වැඩි දියුණු කළ යුතු ය.

ශ්‍රී ලංකාව ගත හොත් එහි දූෂණය පවතිනවා පමණක් නො ව, දූෂණය වැඩිවෙමින් පවතී. එහෙයින් සමාජය අවදි වී, ශ්‍රී ලංකාව දූෂණයෙන් මුදවා ගැනීමට හදිසි ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.